පොදු වක්‍ර ලේඛ අංකය 01-37 /2019

මගේ අංකය PA/DDG PHS II/1/MHD/2019
සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
කොළඹ 10
2019.07.03

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
අධ්‍යක්ෂකවරුන් සෞඛ්‍ය අමාත්‍යාංශය/ විශේෂිත ව්‍යාපාර/ වසංගත රෝග ඒකකය
ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
අධ්‍යක්ෂකවරුන් රේඛීය අමාත්‍යාංශය යටතේ පවතින රෝහල්/ මධ්‍යම රජය යටතේ ඇති රෝහල්
වෛද්‍ය අධිකාරීවරුන් දිස්ත්‍රික් මහ රෝහල්/ මූලික රෝහල් ඒ සහ බී
දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරීවරුන් දිසා රෝහල්
ස්ථාන භාර වෛද්‍ය නිලධාරීන් ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකක
සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

ශ්‍රී ලංකාව වෙත නේවාසික වීසා අයදුම්කරුවන් සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම (HPP) ක්‍රියාත්මක කිරීම පිළිබඳ වක්‍රලේඛය

ශ්‍රී ලංකාවේ ජාතික සංක්‍රමණික සෞඛ්‍ය ප්‍රතිපත්තිය සහ 11/2140/509/159 දරණ 2011.12.14 දිනැති පූර්ව අමාත්‍යමණ්ඩල තීරණ කෙරෙහි අවධානය යොමු කරවමි.

එමෙන්ම, 2018.03.20 වන දින අමප අංක 18/0431/718/023 අනුව ශ්‍රී ලංකාව වෙත නේවාසික වීසා අයදුම්කරුවන් සඳහා සෞඛ්‍ය ඇගයීම් වැඩසටහනක්, සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානයට (IOM) ස්ථාපනය හා ක්‍රියාත්මක කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුමට සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට බලය පැවරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. අවබෝධතා ගිවිසුම 2018.05.04 දින අත්සන් කරන ලදී.

1. ශ්‍රී ලංකාව වෙත සංක්‍රමණය වන්නන් සඳහා වන සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම (HPP) සියළුම නේවාසික වීසා අයදුම් කරුවන් සඳහා අදාල වේ. (මින් නිදහස් කෙරෙන කාණ්ඩයන් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙහි දක්වා ඇත) සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම සඳහා අනිවාර්යය සෞඛ්‍ය ඇගයීමක් සිදු කිරීම අන්තර්ගත වන අතර එය 6 වන වගන්තියෙහි විස්තර කර ඇති පරිදි රජයෙන්ලැබෙන සෞඛ්‍ය රක්ෂණ ආවරණකින් සමන්විත වේ.

2. තෝරාගත් අයදුම්කරුවන් හට සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සංක්‍රමණික සෞඛ්‍ය ඒකකය සහ නිරෝධායන ඒකකය විසින් In-bound Health Assessment Centre/ IHAC C නම් කරන ලද වෛද්‍ය මණ්ඩලයක් විසින් දැනට ක්‍රියාත්මක-සංක්‍රමණය සඳහා වන අන්තර්ජාතික සංවිධානය (IMO) සමග සහයෝගීත්වයෙන් යුතුව නිකුත් කෙරෙන සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම් කාඩ්පතක් ලැබෙනු ඇති අතර අවුරුද්දක කාලයක් වලංගු මෙම කාඩ්පත සඳහා ඇ.ඩො. 75ක ගාස්තුවක් අය කෙරෙයි.

3. IHAC මධ්‍යස්ථානය කොළඹ 8, ඇල්විටිගල මාවත, IBSL ගොඩනැගිල්ල, 10 වන මහල, 80A යන ස්ථානයෙහි පිහිටා ඇත.

4. සෞඛ්‍ය ඇගයීම් සඳහා මැලේරියාව, ක්ෂය රෝගය, HIV සහ බරවා සඳහා රෝග පරීක්ෂාවන් සිදු කිරීම ඇතුලත් වේ. සෞඛ්‍ය ඇගයීම් සිදු කිරීමේදී මෙම රෝග හතර සඳහා රෝග පරීක්ෂාවන් සිදු කිරීමට

අදාලව නම් කරන ලද වෛද්‍ය මණ්ඩලය (Designated Panel Physicians) සඳහා අවශ්‍ය තාක්ෂණික උපදෙස් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික රෝග පාලන වැඩසටහන් මගින් සකස් කර ඇත.

5. මැලේරියාව, HIV, බරවා සහ TB සහිත බවට රෝග පරීක්ෂාවන් මඟින් හඳුනාගැනෙන පුද්ගලයින් එය ස්ථිර කර ගැනීම සඳහා ප්‍රතිකාර සඳහා සහ පසුවිපරම් කටයුතු සඳහා අදාල රෝග වර්ධන වැඩසටහන් වෙත යොමු කෙරෙනු ඇත.

6. අදාල ජාතික රෝග මර්ධන වැඩසටහන මගින් රෝගීන් පසුවිපරම් කටයුතු සඳහා අදාල විමධ්‍යගත ඒකක වෙත යොමු කෙරෙනු ඇත. ශ්‍රී ලංකා පුරවැසියන් සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදු කිරීමට සමාන අන්දමින් අදාල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සහ සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් විසින් ප්‍රජා පසු විපරම් කටයුතු සිදු කල යුතුය.

7. සෞඛ්‍ය ඇගයීමට අමතරව සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය සෞඛ්‍ය ආයතන මගින් සැපයෙන හදිසි සත්කාර සහ ප්‍රාථමික සත්කාර සේවාවන් ආවරණය කෙරෙයි. වලංගු HPP කාඩ්පතක් සතු අයදුම්කරුවන් නොමිලේ සෞඛ්‍ය සේවාවන් ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

8. හදිසි අවස්ථාවකදී හැර සිදු කෙරෙන රජයේ රෝහල් වල රෝහල්ගත කිරීම් හෝ පෞද්ගලික අංශයේ සියළු සෞඛ්‍ය සේවාවන් සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම මගින් ආවරණය නොවේ. හදිසි අවස්ථා සඳහා නොවන රෝහල් ගත කිරීම්වලදී රජයේ සේවාවන් සඳහා ප්‍රවේශවන්නන් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන පුද්ගලයන්ට අදාලව පවත්නා කොන්දේසි අදාල වේ.

9. රාජ්‍ය ලාංඡනය සහිත HPP කාඩ්පත මගින් පෞද්ගලික අනන්‍යතාවක් සහ වලංගු කාලසීමාවක් ලබා දේ. (එහි නම, උපන්දිනය, ජාතිකත්වය, ගමන් බලපත්‍ර අංකය, අදාල නියෝජිත ආයතනය, අනුග්‍රාහකයා, නේවාසික වීසා බලපත්‍රය දරන්නාගේ ඡායරූපය ඇතුලත් වේ)

10. ඒ අනුව ප්‍රේබීය අමාත්‍යාංශ රෝහල් සහ පළාත් අමාත්‍යාංශ (PDHS සහ RDHS) ප්‍රධානීන් විසින් තම පළාත්හි/ දිස්ත්‍රික්කයන්හි පිහිටි සියළු සෞඛ්‍ය සත්කාර ආයතන/ විමධ්‍යගත ව්‍යාපාර ඒකක ප්‍රධානීන් වෙත අවශ්‍ය උපදෙස් ලබාදිය යුතු අතර අනුමත නේවාසික වීසා බලපත්‍ර සහිත HPP කාඩ්පතක් හිමි සංක්‍රමිකයන් සඳහා සැපයිය යුතු සේවාවන් පිළිබඳව අධ්‍යක්ෂකවරුන්/ වෛද්‍ය අධිකාරීන්/ DMOO/ ස්ථාන භාර වෛද්‍ය නිලධාරීන් සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් තම කාර්යය මණ්ඩල දැනුවත් කළ යුතුය.

11. ශ්‍රී ලංකාව තුල මහජන සෞඛ්‍ය සුරක්ෂණය කෙරෙන අතරම මැලේරියාව සහ බරවා රෝගයන් මුලිනුපුටා දැමීම මෙන්ම ක්ෂය රෝගය සහ HIV/AIDS පාලනය කිරීමේ ප්‍රයත්නයන්ට අනුගත වන පරිපූර්ණ සෞඛ්‍ය සේවා ප්‍රවේශයක් තෝරාගෙන ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය ආරක්ෂණ සැලසුම මගින් අපේක්ෂා කෙරෙයි.

.....

වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්
1. ලේකම් - සෞඛ්‍ය පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය